**ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව - 2019**
**---------------------------------------------------------------**

## 1.1 මතය

**------**

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ ("කොමිෂන් සභාව") 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, සංචිත වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

කොමිෂන් සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 මතය සඳහා පදනම

**--------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී.

මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**-----------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු වන පරිදි පිළියෙල කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය කොමිෂන් සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා කොමිෂන් සභාව විසින් පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

----------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම,වරදවා දැක්වීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කොමිෂන් සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි

විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කොමිෂන් සභාව ක්‍රියා කර ඇති බව;

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කොමිෂන් සභාව කටයුතු කර ඇති බව;

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 2. මූල්‍ය සමාලෝචනය
---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය
----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කොමිෂන් සභාවේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය, ශුද්ධ මෙහෙයුම් වියදම් සඳහා සෙස් අරමුදලින් මාරුකිරීම් සැලකිල්ලට ගැනීමට පෙර රු. මිලියන 375.4 ක ඌණතාවයක් වූ අතර ඉකුත් වර්ෂයේදී ඌණතාවය රු.මිලියන 442.5 ක් ලෙස වාර්තා විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී ඌණතාවය රු. මිලියන 67.1 කින් හෙවත් සියයට 15 කින් අඩු වීම සඳහා මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතිය යටතේ රු. මිලියන 81.1 ක ප්‍රදානයක් ලැබීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය
-------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයේ කොමිෂන් සභාවේ, සෙස් අරමුදලේ සහ වන්දි අරමුදලේ ප්‍රධාන ආදායම් විෂයයන් සහ කොමිෂන් සභාවේ ප්‍රධාන වියදම් විෂයයන්, ඉකුත් වර්ෂය සමඟ සසඳා විශ්ලේෂණය කර පහත පරිදි දක්වා ඇත.

| | 2019<br>රු. | 2018<br>රු. | වෙනස ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|
| <u>සෙස් අරමුදලේ සහ වන්දි අරමුදලේ ආදායම්</u> | | | |
| ලද සෙස් ආදායම | 223,020,518 | 250,704,350 | 11.04 |
| සෙස් අරමුදලේ ආයෝජන මත පොළිය | 264,966,403 | 264,406,422 | 0.21 |
| වන්දි අරමුදලේ ආයෝජන මත පොළිය | 44,537,378 | 39,829,392 | 11.82 |
| <u>කොමිෂන් සභාවේ ආදායම්</u> | | | |
| රජයේ ප්‍රදාන | 81,124,254 | - | 100.0 |
| <u>කොමිෂන් සභාවේ වියදම්</u> | | | |
| සේවක වැටුප් | 128,380,689 | 130,974,645 | 2.0 |
| විශේෂ ගෙවීම් | 16,812,135 | 15,882,863 | 5.9 |
| සේවක වාහන දීමනා | 22,344,097 | 19,735,833 | 13.2 |
| සේවක වෛද්‍ය වියදම් හා රක්ෂණය | 6,962,971 | 7,148,920 | 2.6 |
| සේවක සුබසාධනය | 5,896,137 | 4,936,970 | 19.4 |
| විදේශීය පුහුණුව සහ සංචාර | 13,547,075 | 8,417,392 | 60.9 |
| කුලී සහ කාර් පාක් කුලී | 88,188,786 | 81,979,640 | 7.6 |

| | | | |
|---|---|---|---|
| **ප්‍රාග්ධන වෙළඳපොල සංවර්ධන වියදම් - එකතුව** | 53,736,624 | 85,159,152 | 36.9 |
| • ප්‍රාග්ධන වෙළඳපොල හා නිෂ්පාදන සංවර්ධනය | 24,669,537 | 48,933,373 | 49.6 |
| • මහ ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් | 13,407,274 | 20,632,925 | 35.0 |
| • අධ්‍යාපන වැඩසටහන් | 3,480,812 | 3,636,294 | 4.3 |
| • ජාත්‍යාන්තර සාමාජිකත්ව ගාස්තු - අයි.ඕ.එස්.සී.ඕ | 3,730,324 | 3,529,660 | 5.7 |
| • ප්‍රසිද්ධිය සහ ප්‍රචාරණය | 482,114 | 233,800 | 106.2 |
| • වෙළඳපොල පරීක්ෂණ පිරිවැය | 7,878,105 | 8,167,459 | 3.5 |
| • විමර්ශනය සහ පරීක්ෂාකිරීමේ වියදම් | 88,458 | 25,641 | 245.0 |

අ. ලෝක බැංකුව විසින් අරමුදල් සපයනු ලබන මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතියේ කොටසක් ලෙස, නම් කරන ලද ව්‍යාපෘති 11 ක් සඳහා දළ වශයෙන් ඇමරිකානු ඩොලර් මිලියන 21 ක් ලබා ගැනීමට කොමිෂන් සභාව හිමිකම් ලබයි. සමාලෝචිත වර්ෂය අවසානයේදී, ව්‍යාපෘතියේ ප්‍රතිඵල පදනම් කරගත් මූල්‍ය සංරචකයේ කොටසක් ලෙස කොමිෂන් සභාවට රු. මිලියන 81.1 ක් ලැබී තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී දරණ ලද රු. මිලියන 1 ක සාමාන්‍ය වියදම්වලට අමතරව, ප්‍රතිඵල පදනම් කරගත් මූල්‍ය සංරචකයට අදාළව කිසියම් නිශ්චිත වියදමක් කොමිෂන් සභාව විසින් දැරීමට අවශ්‍ය නොවේ. ඒ අනුව, ලද මුළු මුදල සමාලෝචිත වර්ෂය සඳහා ආදායමක් (රජයේ ප්‍රදාන) ලෙස හඳුනාගෙන ඇත.

ආ. ප්‍රාග්ධන වෙළඳපොල හා නිෂ්පාදන සංවර්ධනය සඳහා සමාලෝචිත වර්ෂයේ වියදම රු. මිලියන 24.7 ක් විය. එහි ප්‍රධාන වශයෙන් තැරැව්කරුවන්ගේ පසුපෙල කාර්යාල පද්ධතිය (Broker Back Office Systems) සහ ඇණවුම් කළමනාකරණ පද්ධතිය (Order Management System) සඳහා වැය කරන ලද රු. මිලියන 20.1 ක් හෙවත් සියයට 81.4 ක් ඇතුළත් විය. තවද, 2019 වර්ෂයේදී සිංගප්පූරුවේ පැවති ආයෝජක සංසදය වෙනුවෙන් රු. මිලියන 3.4 ක් හෙවත් සියයට 13.8 ක් වැය කර තිබුණි.

ඇ. 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 14 බි (2) අ වගන්තිය ප්‍රකාරව ප්‍රාග්ධන වෙළඳපොල සංවර්ධනය කිරීම සඳහා එම පනත යටතේ අයකරනු ලබන සෙස් බදුවලින් වියදම් දැරීමට බලය දී තිබේ. ඒ අනුව, සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රාග්ධන වෙළඳපොල සංවර්ධන කටයුතු සඳහා මුළු වියදමෙන් සියයට 11.8 ක් වැය කර තිබුණු අතර ඊට සාපේක්ෂව ඉකුත් වර්ෂයේදී එය සියයට 18.1 ක් විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළදී විමර්ශන අංශය විසින් හසුරුවන ලද සිද්ධීන් 37 ක් අතුරින් සිද්ධීන් 4 ක විමර්ෂණ සමාලෝචිත වර්ෂය තුළදී සම්පූර්ණ කළ තිබුණු අතර සාක්ෂි නොමැති වීම හේතුවෙන් එක් සිද්ධියක විමර්ෂණ නවතා තිබුණි. සිද්ධීන් 15 ක විමර්ෂණ වාර්තාකරණ අදියරෙහි පැවතුණු අතර 2013 ජූලි මාසයේ සිට 2019 ඔක්තෝබර් මාසය දක්වා කාලය තුළදී ලියාපදිංචි කළ අනෙකුත් සිද්ධීන් 17 හි | විසඳීමට තිබෙන විමර්ශන කඩිනම් කිරීම සහ අවසන් කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ඇත. | දැනට පවතින සියලු විමර්ශන අවසන් කිරීමට ප්‍රමුඛතාව ලබා දිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | විමර්ශන කටයුතු සමාලෝචිත වර්ෂය අවසන් වන දිනට කෙරීගෙන යමින් පැවතුණි. | | |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළදී ආයතනික කටයුතු අංශය විසින් ඉදිරිපත් කරන ලද ලැයිස්තුගත කිරීමේ රීති පිළිබඳ පත්‍රිකා ඇතුළු නියාමන පත්‍රිකා පහක් 2020 සැප්තැම්බර් 30 දින වන විටත් නියාමන කමිටුවේ සහ කොමිෂන් සභාවේ සාමාජිකයින්ගේ සාකච්ඡාවට භාජනය වී නොතිබුණි. | නියාමන කමිටු රැස්වීම් සමාලෝචිත වර්ෂය තුළ නොපැවැත්වුණි. කෙසේ වෙතත්, සාකච්ඡාවට භාජනය නොවූ නියාමන කමිටු පත්‍රිකා සාකච්ඡා කිරීම සඳහා නියාමන කමිටු රැස්වීම් අඛණ්ඩව සංවිධානය කිරීමට අවශ්‍ය පියවර දැන් ගෙන තිබේ. | ඒ අනුව නියාමන කමිටු රැස්වීම් පැවැත්විය යුතුය. |
| (ඇ) | කොළඹ කොටස් හුවමාරුව සමඟ එක්ව සිදු කරනු ලබන මධ්‍යම පාර්ශ්වීකරණ යාන්ත්‍රණය (Central Counter Party Mechanism - CCP) ක්‍රියාත්මක කිරීමේ පියවරක් ලෙස ක්‍රියාත්මක කරනු ලබන භාරදීමට එරෙහිව ගෙවීම් (Delivery Versus Payment - DvP) ක්‍රමය 2018 වර්ෂයේ පළවන කාර්තුව අවසානයේදී සම්පූර්ණ කිරීමට සැළැසුම් කර තිබූ අතර එය 2019 වර්ෂයේ පළවන කාර්තුව දක්වා දීර්ඝ කර තිබුණි. කෙසේවෙතත්, භාරදීමට එරෙහිව ගෙවීම් ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ කටයුතු 2020 සැප්තැම්බර් 30 දින වන විටත් කෙරීගෙන යමින් පැවතුණි. | භාරදීමට එරෙහිව ගෙවීම් ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා නියාමන මග පෙන්වීම කොමිෂන් සභාව සපයන අතර එය ක්‍රියාත්මක කිරීමේ වගකීම කොළඹ කොටස් හුවමාරුව සතු බව සැලකිල්ලට ගැනීම වැදගත්ය. එබැවින්, මෙම ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම කොමිෂන් සභාවේ පාලනයෙන් බැහැර වේ. තවද, එය ක්‍රියාත්මක කිරීමට අදාළව කොළඹ කොටස් හුවමාරුව මේ වන විට ඉන්දියාවෙන් උපකරණ ආනයනය කිරීම සම්බන්ධයෙන් අභියෝගයන්ට මුහුණ දී සිටී. කෙසේ වෙතත්, එය ක්‍රියාත්මක කිරීමට අදාළව කොමිෂන් සභාව අඛණ්ඩව කොළඹ කොටස් හුවමාරුව සමඟ සම්බන්ධ වේ. | මධ්‍යම පාර්ශ්වීකරණ යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීම සඳහා වන භාරදීමට එරෙහිව ගෙවීම් ක්‍රමය ක්‍රියාත්මක කිරීම සම්පූර්ණ කිරීම සඳහා සම්බන්ධවීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම. |
| (ඈ) | 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 14 බි (2) අ වගන්තිය ප්‍රකාරව එම පනත යටතේ අයකරනු ලබන සෙස් බදුවලින් වියදම් දැරීමට බලය දී ඇති, ප්‍රාග්ධන වෙළඳපොල හා නිෂ්පාදන සංවර්ධනයට සමාලෝචිත වර්ෂය සඳහා රු. මිලියන 57.3 ක් අයවැය ගතකර තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළදී ඒ වෙනුවෙන් රු. මිලියන 24.7 ක වියදමක් දරා තිබුණි. කෙසේ වෙතත්, මධ්‍යම පාර්ශ්වීකරණ යාන්ත්‍රණය (රු. මිලියන 12.3 ක මුදලක් අයවැය ගත කර තිබුණි.) සහ ඒකක භාර ප්‍රවර්ධන වැඩසටහන (රු. මිලියන 10 ක මුදලක් අයවැය ගත කර | මධ්‍යම පාර්ශ්වීකරණ යාන්ත්‍රණය සඳහා උපදේශන ගාස්තු වෙනුවෙන් අයවැයගත පිරිවැය, කොන්ත්‍රාත් ආරවුල් සහ පිළිගත හැකි විසඳුමකට එළඹීම සඳහා කෙරීගෙන යන සාකච්ඡා හේතුවෙන් වියදම් කර නොමැත. මීට අමතරව, පාස්කු ඉරිදා ප්‍රහාරය, දේශපාලන අවිනිශ්චිතතාව සහ 2019 ජනාධිපතිවරණය හේතුවෙන් Road Shows සහ ඒකක භාර වැඩ සටහන් ඇතුළු අනෙකුත් | ප්‍රාග්ධන වෙළඳපොළ සංවර්ධනය කිරීම සඳහා ප්‍රමුඛතාව ලබා දීම. |

| | | | |
|---|---|---|---|
| | තිබුණි.) සඳහා කිසිදු මුදලක් සමාලෝචිත වර්ෂය තුළදී දරා නොතිබුණි. | ප්‍රාග්ධන වෙළඳපොළ සංවර්ධන කටයුතු ප්‍රමාද වී ඇත. | |
| (ඉ) | 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 14 බි (2) අ වගන්තිය ප්‍රකාරව එම පනත යටතේ අයකරනු ලබන සෙස් බදුවලින් වියදම් දැරීමට බලය දී ඇති මහ ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන්වලට සමාලෝචිත වර්ෂය සඳහා රු. මිලියන 29.1 ක් අයවැය ගතකර තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළදී ඒ වෙනුවෙන් රු. මිලියන 13.4 ක් හෙවත් සියයට 46 ක් පමණක් වියදම් කර තිබුණි. | ජනාධිපතිවරණය හේතුවෙන් උසස් පෙළ සිසුන් සඳහා වන ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන පැවැත්වීමට නොහැකි විය.<br>නව සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත පිළිබඳ සම්මන්ත්‍රණ මාලාවන් පවත්වනු නොලැබූ අතර නව සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ අදාළ වගන්ති නොමැති වීමෙන් "අයෝජනයට මුලපුරමු" නැමැති පොත ඇතුළු බොහෝ ප්‍රකාශන මුද්‍රණය කර හෝ නැවත මුද්‍රණය කර නොමැත.<br>පාස්කු ප්‍රහාරයේ හා ජනාධිපතිවරණයේ බලපෑම හේතුවෙන් ආයෝජක / සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සම්මන්ත්‍රණ සහ 2019 ලෝක ආයෝජක සතියේ වැඩසටහන් ද නොපැවැත්විණි. | ප්‍රාග්ධන වෙළඳපොළ සංවර්ධනය කිරීම සඳහා ප්‍රමුඛතාව ලබා දීම. |
| (ඊ) | 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතට අනුව, 2018 අප්‍රේල් 01 දින සිට බලපැවැත්වෙන පරිදි ආදායම් බදු සඳහා කොමිසම සභාව වගකීමට යටත්වේ. කෙසේ වෙතත්, කොමිෂන් සභාව විසින් 2018/2019 සහ 2019/2020 තක්සේරු වර්ෂ සඳහා ආදායම් බදු 2020 සැප්තැම්බර් 30 දින වන විටත් ගෙවා නොතිබුණි. 2018/2019 සහ 2019/2020 තක්සේරු වර්ෂ සඳහා ගෙවිය යුතු ආදායම් බදු පිළිවෙලින් රු. මිලියන 12.7 ක් සහ රු. මිලියන 20.6 ක් විය. | 2017/2018 තක්සේරු වර්ෂය දක්වා භුක්ති විඳි බදු නිදහස් කිරීම, නව බදු නීතියට අනුකූලව යථා තත්වයට පත් කරන ලෙස කොමිෂන් සභාව විසින් මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිපියක් යොමු කරමින් ඉල්ලා සිටියේය. කොමිෂන් සභාව දැනට ප්‍රතිචාරයක් බලාපොරොත්තුවෙන් සිටී. | එකී පනතට අනුකූල නොවීම වැළැකීම සඳහා කඩිනම් පියවර ගැනීම. |

## 3.2 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1987 අංක 36 දරණ ශ්‍රී ලංකා සුරකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 43 (2) වගන්තිය ප්‍රකාරව, පත් කරන ලද නිලධරයන්ට සහ සේවකයින්ට කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් තීරණය කරනු ලබන ආකාරය හා අනුප්‍රමාණ අනුව වැටුප් ගෙවිය යුතු අතර, කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් තීරණය කරනු ලබන සේවා කොන්දේසිවලට ඔවුන් යටත් විය යුතුය. තවද, 1992 මාර්තු 31 දිනැති මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ලිපිය ප්‍රකාරව, වෙනත් රජයේ රෙගුලාසි සලකා බැලීමෙන් තොරව සිය කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට සහ ඔවුන්ගේ වැටුප් හා අනෙකුත් දීමනා නියම කිරීම සඳහා කොමිෂන් සභාවට නිදහස තිබේ.<br><br>ඒ අනුව, කාර්ය මණ්ඩලයේ වැටුප් පරිමාණයන් සහ විශේෂ ජීවන දීමනාව, මාසික දීමනාව, කාර්ය මණ්ඩල වෛද්‍ය වියදම්, කාර්ය මණ්ඩල වාහන දීමනාව හා විශේෂ ගෙවීම් වැනි අනෙකුත් දීමනා කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් වරින් වර තීරණය කර තිබුණි.<br><br>කෙසේ වෙතත්, 2018 සැප්තැම්බර් 18 දිනැති පොදු ව්‍යාපාර කාරක සභාවේ (කෝප්) රැස්වීමේ නිර්දේශයට අනුව කොමිෂන් සභාව සිය කාර්ය මණ්ඩලයට ලබා දෙන වැටුප් හා දීමනා සම්බන්ධයෙන් ජාතික වැටුප් කොමිෂන් සභාවේ එකඟතාවය ලබා ගත යුතුය. කොමිෂන් සභාව විසින් 2020 සැප්තැම්බර් 30 දින වන විටත් එවැනි එකඟතාවයක් ලබාගෙන නොතිබුණි. | කොමිෂන් සභාව විසින් ඉහත කාරණය සම්බන්ධයෙන් ගරු. නීතිපතිතුමාගෙන් මතය විමසන ලද අතර ඊට ප්‍රතිචාර වශයෙන් කොමිෂන් සභාව සේවකයින් බඳවා ගැනීම හා වැටුප් පිළිබඳ සිය තීරණවලට අදාළව පූර්ව අනුමැතියක් හෝ අවසරයක් ලබා ගැනීමට නීතියෙන් අවශ්‍ය නොවන බව ගරු. නීතිපතිතුමා විසින් උපදෙස් දී තිබේ. | පොදු ව්‍යාපාර කාරක සභාවේ රැස්වීමේ නිර්දේශයට අනුව සිය කාර්ය මණ්ඩලයට ලබා දෙන වැටුප් හා දීමනා සම්බන්ධයෙන් ජාතික වැටුප් කොමිෂන් සභාවේ එකඟතාවය ලබා ගැනීම. |
| (ආ) | 2017 දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවේ අනුමත කාර්ය මණ්ඩලය 96 ක් වූ අතර මෙම කාර්ය මණ්ඩලය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන තිබුණි. 2018 ජනවාරි 22 දින පැවති 404 වැනි කොමිෂන් සභා රැස්වීමේදී, කොමිෂන් සභාවේ වේතන කමිටුවේ තීරණ එනම් | ගරු නීතිපතිතුමාගේ ඉහත මතය අනුව, කොමිෂන් සභාව විසින් සේවකයින් බඳවා ගැනීම හා ඔවුන්ගේ සේවකයින්ගේ වැටුප් හා දීමනා වැඩි කිරීම සම්බන්ධයෙන් මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ කළමනාකරණ | වැඩි කරන ලද 41 ක් වූ කාර්ය මණ්ඩලය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම. |

| | | | |
|---|---|---|---|
| | "භාණ්ඩාගාර ලේකම් විසින් නිකුත් කරන ලද 1992 මාර්තු 31 දිනැති විධානයට අනුව, කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට කොමිෂන් සභාවේ සාමාජිකයින්ට නිදහස තිබේ නම් කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ සංයුතිය කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් තීරණය කළ යුතු බව සහ අතීතයේ දී අනුගමනය කළ පරිදිම අනුමැතිය ලබා ගැනීම කොමිෂන් සභාව විසින් නතර කළ යුතු බව පැහැදිලි වේ" යන්න කොමිෂන් සභාවේ සාමාජිකයන් විසින් අනුමත කර තිබුණි. ඒ අනුව කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය 96 සිට 137 දක්වා වැඩි කර තිබුණි.<br><br>කෙසේ වෙතත්, 2018 ජූලි 18 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 03/2018 අනුව, අදාළ බලධාරින් විසින් මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය ලබා ගැනීමකින් තොරව සේවකයින් බඳවා ගැනීමෙන් සහ සේවකයින්ගේ වැටුප් හා දීමනා වැඩි කිරීමෙන් වැලකී සිටිය යුතුය. නමුත්, කොමිෂන් සභාව විසින් වැඩි කරන ලද 41 ක් වූ කාර්ය මණ්ඩලය සඳහා එවැනි අනුමැතියක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ලබා ගෙන නොතිබුණි. | සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය නොවේ. | |
| (ඇ) | 2017 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලයට අයත් ප්‍රාග්ධන වෙළඳපොල සංවර්ධන අධ්‍යක්ෂක, විමර්ශන අධ්‍යක්ෂක, මානව සම්පත් අධ්‍යක්ෂක, අධීක්ෂණ අධ්‍යක්ෂක සහ මූල්‍ය හා පරිපාලන අධ්‍යක්ෂක යන තනතුරු 2020 සැප්තැම්බර් 30 දිනට පුරප්පාඩුව පවතින බව නිරීක්ෂණය විය. | මෙහි සඳහන් පුරප්පාඩු හදිසි පදනමක් මත පිරවීම සඳහා කොමිෂන් සභාව දැනටමත් අවශ්‍ය පියවර ගෙන තිබේ. | පුරප්පාඩු වූ තනතුරු පිරවීම සඳහා ප්‍රමුඛත්වය ලබා දීම. |
| (ඈ) | 2016 අප්‍රේල් 19 දින සිට බලපැවැත්වෙන පරිදි කොමිෂන් සභාවේ එක් නිලධාරියෙකුගේ සේවය තහනම් කර තිබුණි. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ 31.11 උප වගන්තියට පටහැනිව වාහන දීමනාව හා අනෙකුත් ප්‍රතිලාභ හැර මාසික දළ වැටුපෙන් හරි අඩකට සමාන මුදලක් ගෙවීම් කර තිබුණි. 2016 අප්‍රේල් 20 සිට 2018 අගෝස්තු 31 දක්වා කොමිෂන් සභාව විසින් | කොමිෂන් සභාව විසින් සේවය තහනම් කරන ලද සේවකයාට මාස භාගයක වැටුප ගෙවීම අත්හිටුවා ඇති අතර 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු ශේෂයක් ලෙස ගෙවා ඇති මුදල හඳුනාගෙන තිබේ. තවද, කොමිෂන් සභාව විසින් මෙහි සඳහන් රු. මිලියන 5.2 ක මුදල පියවීම සඳහා සිහිගැන්වීමේ | පොදු ව්‍යාපාර කාරක සභාවේ නිර්දේශය අනුව ගෙවන ලද මුළු වැටුප අය කර ගැනීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම. |

| | | |
|---|---|---|
| දරන ලද අර්ධ මාසික වැටුප් වියදම රුපියල් 5,212,815 ක් විය.<br>2018 සැප්තැම්බර් 18 දිනැති පොදු ව්‍යාපාර කාරක සභාවේ (කෝප්) රැස්වීමේ නිර්දේශයට අනුව, කොමිෂන් සභාව වැටුප් ගෙවීම නැවැත්විය යුතු අතර ගෙවන ලද මුළු වැටුප අය කර ගැනීමට කටයුතු කළ යුතුය. ඒ අනුව, 2018 සැප්තැම්බර් මස සිට බලපැවැත්වෙන පරිදි අර්ධ මාසික වැටුප ගෙවීම නවතා තිබූ අතර ඉහත සඳහන් මුදල ආපසු ගෙවන ලෙස 2018 නොවැම්බර් 15 දිනැති ලිපියෙන් නිලධාරියාට දන්වන ලදී. කෙසේ වෙතත්, කොමිෂන් සභාව විසින් 2020 සැප්තැම්බර් 30 දින වන විටත් එය අය කරගෙන නොතිබුණි. | ලිපි දැනටමත් යවා ඇත. | |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 4.1 අයවැය ලේඛනමය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අයිතම් 18 ක අයවැයගත වියදම හා තථ්‍ය වියදම අතර සියයට 33 සිට සියයට 354 දක්වා පරාසයක ප්‍රමාණාත්මක විචලනයන් නිරීක්ෂණය වුයෙන්, අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය. | 2019 අප්‍රේල් මාසයේ සිදු වූ පාස්කු ප්‍රහාරයේ අහිතකර බලපෑම හේතුවෙන් ප්‍රාග්ධන වෙළඳපොළ සංවර්ධනය, මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් සහ අධ්‍යාපන වැඩසටහන් සඳහා වන වියදම් අඩුවෙන් දරණ ලදී. | අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගැනීම. |